# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2279/07 – 2022 මැයි 09 වැනි සඳුදා – 2022.05.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/E/2014/159.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.28 දිනැති හා අංක 2208/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, අංක 457 හි පදිංචි එක්සත් වෙළෙඳ සේවා සංගමය (බන්දුල රාජමුණි මහතා වෙනුවෙන්) සහ බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82 හි පිහිටි රාජ්‍ය දැව සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.03.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: A/78/2020

**කාර්මික අධිකරණය**

1. එක්සත් වෙළෙඳ සේවා සංගමය
(බන්දුල රාජමුණි මහතා වෙනුවෙන්),
අංක 457,
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
කොළඹ 02.

*පළමු පාර්ශ්වය*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. රාජ්‍ය දැව සංස්ථාව
අංක 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

ගරු කම්කරු අමාත්‍ය, නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2020 දෙසැම්බර් මස 10 වැනි දින අංක IR/COM/04/E/2014/159 හා 2020.12.10 වැනි දින දරන නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

*පළමු පාර්ශ්වය*

1. එක්සත් වෙළෙඳ සේවා සංගමය
(බන්දුල රාජමුණි මහතා වෙනුවෙන්),
අංක 457,
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

2. රාජ්‍ය දැව සංස්ථාව
අංක 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් සමාංක හා 2020.12.08 දිනැති ලිපිය මගින් සඳහන් කර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ විගණන පරීක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කරන බන්දුල රාජමුණි මහතාට,

(i) වෘත්තීය සමිති කටයුතුවල නිරතවීම සඳහා ලබා දී තිබූ සතියේ එක් දිනක රාජකාරි නිවාඩුව අවලංගුකර ඒ වෙනුවෙන් 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ ලබාගත් නිවාඩු ඔහුට හිමි වාර්ෂික නිවාඩුවලින් අඩු කිරීමට සහ තවත් ඉතිරියක් වේ නම් එම නිවාඩු වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට ගෙන ඇති තීරණය හේතුවෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න, හා

(ii) 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ බන්දුල රාජමුණි මහතා ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වූ දිනයන් අතරින් ප්‍රමාද වී පැමිණි දිනයන් ලෙස සලකා ඔහුගේ වාර්ෂික නිවාඩුවලින් අඩු කිරීමට සහ තවත් ඉතිරියක්වේ නම් එම නිවාඩු වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට ගෙන ඇති තීරණය හේතුවෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න, හා

(iii) 2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේ වැටුප් වර්ධක අත්හිටුවීම සහ 2014 වර්ෂයේ ප්‍රසාද දීමනා අහිමිකිරීම හේතුවෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය -**

පහත සඳහන් දිනයන්හිදී නඩු අංක A3618 හා A/78/2020 යටතේ විභාගයන් සඳහා කැඳවීම් කර විභාග පවත්වා ඇත.

2016.03.18 සිට
2016.11.28 දක්වා මාස 09 ක් තුළ 9 වාරයක් ද

2017.01.04 සිට
2017.12.12 දක්වා මාස 12 ක් තුළ 9 වාරයක් ද

2018.01.29 සිට
2018.11.28 දක්වා මාස 11 ක් තුළ 10 වාරයක් ද

2019.01.28 සිට
2019.12.10 දක්වා මාස 12 ක් තුළ 9 වාරයක් ද

2020.01.21 සිට
2020.02.28 දක්වා මාස 02 ක් තුළ වාර 2 ක් ද

කාර්මික අධිකරණ/බේරුම්කාරවර පුරෝගාමී විනිශ්චයකරු ලෙස ටී. පියසෝම මැතිතුමා කටයුතු කර විභාගකර ඇති අතර පූර්ව සාක්ෂි සටහන් නිවැරදි කිරීම සඳහා දින හා ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කිරීමට දින ලබාදී තිබුණ ද, උද්ගතව තිබූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බේරුම්කරණ විනිශ්චයෙන් ඉවත්ව ඇත. ඒ නිසා උක්ත බේරුම්කරණය ගරු කම්කරු අමාත්‍යතුමාගේ නියෝගයෙන් කම්කරු ලේකම්තුමා හා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2020.12.10 දින සිට මා වෙත පවරා ඇත.

එබැවින් මෙම කාර්මික ආරාවුල A3618 නඩුව යටතේ විභාග වූ කාර්මික ආරාවුලකට හේතු බැවින්ද, දැනට මෙම නඩු කටයුතු සඳහා ඒ වනවිට අවුරුදු 04 ක් පමණ කල් ගතවී ඇතත් බේරුම්කරණය වී නොමැති හෙයින් ද, ඉල්ලුම්කරු හා වගඋත්තරකරුවන්ගේ එකඟතාවයෙන් මෙම නඩුවේ විභාග සටහන්, ලිඛිත ප්‍රකාශයන් හා ඉදිරිපත් කරන ලද ලකුණු කරන ලද ලේඛන, අංක A/78/2020 නඩුවට අදාළ වන හෙයින් ඒ අනුව බේරුම්කරණය ඉදිරියටත් කරගෙන යාමට මා විසින් කටයුතු කර ඇත.

ඒ අනුව, පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක 78/2020 යටතේ විභාගයන් සඳහා කැඳවීම් කර විභාග පවත්වා ඇත.

2021 ජනවාරි මස සිට
2021.02.15
2021.03.03
2021.03.18
2021.03.31
2021.04.05
2021.04.23 දක්වා 6 වාරයක් ද ලෙස විභාග කර ඇත.

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන එක්සත් වෙළෙඳ සේවා සංගමය බන්දුල රාජමුණි මහතා බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ පිහිටි රාජ්‍ය දැව සංස්ථාවට අනුබද්ධ මොරටුව, කල්දේමුල්ලේ, රාජ්‍ය දැව සංස්ථාවේ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ විගණක නිලධාරියෙකු ලෙස සේවය කර ඇත. ඔහු ඉහත එක්සත් වෙළෙඳ සේවා සංගමයේ රාජ්‍ය දැව සංස්ථාවේ ශාඛාවේ ලේකම් ලෙසත්, මව් සංගමයේ සහකාර ලේකම් ලෙසත් කටයුතු කරන අතරතුර වෘත්තීය සමිති කටයුතු සඳහා සහභාගිවීමේ දී මෙතෙක් භුක්ති විඳි රාජකාරි නිවාඩු අවලංගු කිරීම මත සිදුව ඇති ආරාවුල සමථයකට පත්කොට නිසි විනිශ්චයක් ලබාදීමට කටයුතු කළ යුතුව ඇත.

**නිගමනය -**

මෙම බේරුම්කරණ කාර්යයේදී විශේෂයෙන්ම අදාළ ඉල්ලුම්කරු දැනට විශ්‍රාම ගෙන වසරකට අධික කාලයක් ගතවී තිබීමත්, 2016 සිට වසර 5 ක පමණ කාලයක් බේරුම්කරණයේ ගතවී තිබීමත්, පවතින කොවිඩ් වසංගත තත්ත්වය හා අර්බුදකාරී පාරිසරික තත්ත්වයත් සැළකිල්ලට ගෙන, රාජ්‍ය දැව සංස්ථාවේ නීති නිලධාරිණිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවල සඳහන්ව ඇති කරුණු සැළකිල්ලට ගෙන, එසේම එම කරුණු අතර ඉල්ලුම්කරු වෙත ඉදිරිපත්කොට ඇති ලිපියකින් තහවුරු වන වෘත්තීය සමිති රාජකාරි සඳහා කරනු ලබන දීමනාව වරප්‍රසාදයක් ලෙස සැලකීම 1999 වසරට පමණක් නොවන සේ නිගමනයකොට අදාළ ඉල්ලුම්කාර පාර්ශවයෙන් ඉදිරිපත් වූ කරුණු හා වසර 34 ක සේවා කාලයක් සැපිරූ සේවක මහතෙකු ලෙස කිසියම් සාධාරණ බේරුම්කරණයක් ලබාදීම පිණිසත් දෙපාර්ශවයෙන් ලත් ඉදිරිපත් කිරීම්, පැහැදිලි කිරීම් හා සාක්ෂි මත පදනම්ව මෙම බේරුම්කරණය පහත සඳහන් තීරණයන් මත බේරුම්කරණයකොට අවසන් කිරීමට කටයුතු කරමි.

**තීරණය -**

මෙම අධිකරණයේදී ඉදිරිපත් වූ කරුණුත්, බේරුම්කරණ ගොනුවල හා දෙපාර්ශවය ඉදිරිපත් කරන ලද කරුණුත් සැළකිල්ලට ගෙන පහත සඳහන් නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ පාලන අධිකාරිය වෙත දැන්වීමට තීරණය කරමි.

**නියෝග -**

01.

(i) A8 ලේඛනය පරිදි 2014 ඔක්තෝබර් මස සිට 2015 මැයි මස වැටුපෙන් අයකර අවකරණය කරන ලද දින 38 පහත සඳහන් පරිදි දින යළි ගණනය කොට අදාළ මුදල පැමිණිලිකරුට ප්‍රතිපූර්ණය කිරීම. 21/96 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වෘත්තීය සමිති කටයුතු සඳහා දින 2 ක රාජකාරි නිවාඩු හිමිකම ලැබෙන බැවින්, එම උපලේඛනයේ සඳහන් මාස 8 වෙනුවෙන් සිකුරාදා දින 2 බැගින් දින 16 ක් වෙනුවෙන් රාජකාරි නිවාඩු ලබා දීම.

(ii) තවද වැටුප් රහිත නිවාඩු ලෙස සළකා වැටුප අවකරණය කර ඇති එම දින 38න් ඉහත 01.1 පරිදි ලබා දෙන හිමිකම අනුව ඉතිරි දින 22 සඳහා 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥා පනතේ අංක 21 නිවාඩු හිමිකම් ඡේදයේ අංක 28 හිලව් නිවාඩු ලෙස ලබාදීමට පසු වර්ෂයකදී හෝ පසු වර්ෂවලදී වර්ෂ 04 ක් දක්වා කාලය තුළ හෝ නිවාඩු ඉතිරියක් වේ නම් ලබාදීමත් තවත් දින ඉතිරියක් වේ නම් එහි අංක 33.1, 33.2 යන රාජකාරි නිවාඩු නිල කටයුත්තක් සඳහා වැඩකරන ස්ථානයෙන් බැහැර යාමට සිදුවූවායැයි සළකා එකී දින වැටුප් සහිත නිවාඩු ලෙස සැළකීමෙන් මෙම වැටුප් අවකරනය කර ඇති දින ගණන වරප්‍රසාදයක් ලෙස ලබාදීම.

(iii) ඒ අනුව වැටුපෙන් අවකරණය කර ඇති රු. 55,096.29 ක මුදල ඉල්ලුම්කරුට ලබාදීම.

02.

(i) මෙම ආරවුල නිසා 2014 ඔක්තෝබර් මස සිට 2015 ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය තුළ ඔහුට අහිමි කර ඇති වැටුප් වර්ධකය ඉහත තීරණය පරිදි උපයාගත් ලෙස සළකා ලබාදීම.

(ii) එසේම ඒ අනුව ඔහුට හිමි ශ්‍රේණියේ උසස්වීම ලබා දීම.

(iii) එකී හිමි උසස්වීම අනුව ලැබිය යුතු හිඟ වැටුප් ගණනය කර ගෙවීම.

03. 2014 වර්ෂයට අදාළ වාර්ෂික ප්‍රසාද දීමනාව නොගෙවා ඇත්නම් එම ප්‍රසාද දීමනාව ලබා දීම.

04. දැව සංස්ථාවේ වසර 30 ක සේවා කාලයක් සම්පූර්ණ කරන සියලුම සේවකයන්ට ප්‍රසාද නිල තිළිණයක් ලෙස ලබා දෙන රන් පවුම ඔහුට ද ලබා දීම.

රට තුළ මේ වන විට උද්ගතව ඇති කොවිඩ් වසංගත තත්ත්වය හා කාර්යාලයීය කටයුතු පවත්වාගෙන යැමේ අර්බුදකාරීවූ පාලනයෙන් බැහැර තත්ත්වයන් මත බේරුම්කරන ප්‍රදාන තීරණ නියෝගය නිකුත් කිරීම පමා වූ බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

කෙසේ වුවද මෙම බේරුම්කරන නියෝගය දෙපාර්ශවීය එකඟතාවය මත යුක්ත යුක්ති සහගතව තීරණය කළ බවත්,

දෙපාර්ශවයේම විවෘත කරුණු විමසීමෙන් අනතුරුව මෙම බේරුම්කරණ නඩුව සමථයකට පත්කරන බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

මෙසේ අවසන්වන බේරුම්කරණයේ දී කොළඹ කාර්මික අධිකරණයෙහි සේවක මණ්ඩලයෙන් ද දෙපාර්ශවය වෙනුවෙන් සහභාගිත්වය ලබාදෙන ලද නීතිඥ මහතුන්, නිලධාරින් ඇතුළු සැම වෙතින්ද, රාජ්‍ය දැව සංස්ථාව හා එක්සත් වෙළඳ සේවා සංගමය වෙතින් ද ලද යහපත් ප්‍රතිචාර පිළිබඳව ප්‍රශංසා කළ හැකි බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

රාජ්‍ය දැව සංස්ථාවේ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ විගණන පරීක්ෂක නිලධාරියෙකු ලෙස සේවය කළ බන්දුල රාජමුණි මහතාට නියෝග අංක 01. (iii) පරිදි රු. 55,096.29 ක මුදල හා නියෝග අංක 02 (i), (ii), (iii) හි පරිදි මුදල් ගණනය කර ගෙවීමට ද,

නියෝග අංක 03 හා 04 ගෙවීමට ද,

යන මේ ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ දින සිට මාස දෙකක් ඇතුළත නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත්කොට ලබාදීමටත්,

රාජ්‍ය දැව සංස්ථාව වෙත නියෝග කරමි.

ඉහත සඳහන් ප්‍රදානය යුක්ති සහගත හා සාධාරණ බව සඳහන්කොට මෙකී නඩුව අවසන් කරමි.

සරත් චන්ද්‍රසිරි විතාන,
බේරුම්කරු.

2022 මාර්තු මස 10 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 05 – 0032

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.